AAT SRI LANKA

**ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීමේ නිවේදනය**

# 2026 වර්ෂය සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම

ලොව දෙවන විශාලතම ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ ශිෂ්‍යයෙකු වීමේ අභිමානය අත් විඳිමින් ඔබේ සිහිනයට පියාපත් දෙන්න..!



2025 දෙසැම්බර් 05

**දයාබර ශිෂ්‍යය,**

AAT ආයතනයේ ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචිව වෘත්තීය ගණකාධිකරණ ක්ෂේත්‍රයේ ඉදිරියට පියමං කරන්නට ශ්‍රද්ධාන්විතව තීරණය කළ ඔබට අපගේ ස්තූතිය පුදකරන අතර දේශීයව මෙන්ම විදේශීයව පිළිගත් AAT සුදුසුකම සම්පූර්ණ කර අවසන් විභාගය සමතෙකුව (PF) **NVQ 5 සහිත ඩිප්ලෝමාධාරියකු වීමේ** ජයග්‍රහණය කරා ඉක්මණින් පියමනින්නට අපි ඔබට ආරාධනය කරමු. AAT විභාග සම්පූර්ණ කරන තුරු ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය සක්‍රියව පවත්වාගත යුතු බව කරුණාවෙන් සළකන්න.

ඔබේ මුල් ශිෂ්‍ය ලියාපදිංචිය එම ලියාපදිංචි වූ වර්ෂයට පමණක් වලංගු වන අතර ඉන් පසු එය වාර්ෂිකව අලුත් කළ යුතුය. ඔබ දැනටමත් දන්නා පරිදි, **ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කරන සිසුන්ට පමණක් AAT** විභාග සඳහා අයදුම් කිරීමට, විභාග වලින් නිදහස් වීම සඳහා අයදුම් කිරීමට, ආයතනයෙන් ලිපි ගණුදෙණු සිදුවීමට සහ වෙනත් වරප්‍රසාද හිමි කර ගැනීමට හැකිවේ.

**AAT** සමග ඇරඹූ ඔබේ ජයග්‍රාහී ගමන අවසන් විභාගය සමතෙක් (PF) වනතුරු ක්‍රියාකාරීව පවත්වා ගනිමින් NVQ සහතිකලත් ඩිප්ලෝමාධාරියෙකු (Diploma) වන්න. AAT සිසුන් නිරන්තරව සනාථ කරන පරිදි උසස් පෙළ විභාගයෙන්ද අති විශිෂ්ට ප්‍රතිඵල ලබා විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථා වර්ධනය කර ගනිමින් මෙන්ම AAT අවසන් සුදුසුකම හරහා විවිධ උපාධි සහ පශ්චාත් උපාධි (Degrees and MBAs) අත්පත් කර ගැනීමේ වරප්‍රසාද භුක්ති විඳිමින් අධ්‍යාපන ගමනේ දිදුලන දක්ෂයෙකු වීමට ඔබට පුළුවන. "MAAT" උපාධි නාමයට උරුමකම් කියමින් ඉතාම ලාබාල වෘත්තීය සාමාජිකයෙකු සහ ඉක්මණින් රැකියා නියුක්ත වෙමින් පිළිගත් තරුණ ගණකාධිකාරීවරයෙකු වශයෙන් නොනවතින සාර්ථක වෘත්තීය මගකට පිවිසීමට ඔබට අවස්ථාව හිමි වේ.

**එමෙන්ම නිසි කළට අලුත් කිරීම ඔබව වටිනා ත්‍යාගයක ජයග්‍රාහකයෙකු ද කරයි.**

**2025 ට අදාළ ලියාපදිංචිය අලුත් කිරීමේ අවසන් දිනයට පෙර 2025 සඳහා ලියාපදිංචිය අලුත් කර**

**වටිනා ත්‍යාග දිනූ වාසනාවන්ත සිසුන් 6 දෙනා**

| | | |
|---|---|---|
| **බී. එන්. පී. ඒකනායක**<br>3740743<br>**අනුරාධපුර** | **එස්. කේ. බී. එස්. ජේ. චිරන්තන**<br>3512364<br>**කුරුණෑගල** | **එම්. එම්. එන්. අහමඩ්**<br>3710937<br>**කුරුණෑගල** |
| **එම්. එම්. එම්. මුන්සිෆ්**<br>3980460<br>**මඩකලපුව** | **එම්. එම්. එන්. අයි. එන්. සෙනවිරත්න**<br>3493793<br>**පොළොන්නරුව** | **එම්. ආර්. එෆ්. සුමෙයිරා**<br>4005179<br>**පුත්තලම** |

**මෙම වාසනාවන්ත ත්‍යාගලාභීන් අතරට ඔබේ නමත් එක් කරගන්න... දැන්ම 2026 වසර සඳහා ලියාපදිංචිය අලුත් කරන්න.**

## ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම සඳහා උපදෙස්

**ගාස්තුව**

**රු. 2,750/=**

(පහත සඳහන් දිනට පසු ගෙවන්නේ නම් රු. 500/-ක දඩ මුදලකට යටත්ව රු. 3,250/- ක් ගෙවීමට සිදුවනු ඇත).

**අවසන් දිනය**

2026 ජනවාරි 30

**ගෙවීම් ක්‍රම**

**පළමු ක්‍රමය** [HNB]

හැටන් නැෂනල් බැංකුවේ [HNB] ඕනෑම ශාඛාවක්.

**ගෙවීම් වවුචර** : ඉහත බැංකු වල තබා ඇති සාමාන්‍ය මුදල් තැන්පතු පත් භාවිතා කළ යුතුය. [**CDM යන්ත්‍ර හරහා ගෙවීම් කිරීමෙන් වළකින්න**]

**ගිණුම් අංකය** : HNB – 039020327099

**ගිණුම් හිමියාගේ නම** : AAT ශ්‍රී ලංකා

**ගෙවීම් යොමු අංකය**

"44" මුලින් යොදා **අංක 7කින් යුත් ඔබේ ශිෂ්‍ය ලියාපදිංචි අංකය** නිවැරදිව සඳහන් කළ යුතුය. (උදා : 44×××××××)
(මෙම අංක 07කින් යුත් **ශිෂ්‍ය ලියාපදිංචි අංකය** ඔබේ ශිෂ්‍ය හැඳුනුම්පතේ මෙන්ම මෙම ලිපිය එවන **ලියුම් කවරයේ ඔබේ නම ඉදිරියෙන් ද සඳහන් කර ඇත.**)

**දෙවන ක්‍රමය** [Online]

www.aatsl.lk වෙබ් අඩවියට පිවිස online payment යටතේ ඇති "instructions for existing students' renewal - online" උපදෙස් අනුගමනය කොට online හරහා ගෙවීම. **මෙම ගෙවීම් ක්‍රමයේදී ද ඉහත සඳහන් ගෙවීම් යොමු අංකය නිවැරදිව සඳහන් කළ යුතුය.**

ඉහත යොමු අංකය සඳහන් නොකළහොත් හෝ වැරදියට සඳහන් කළ හොත් ඔබේ ගෙවීම ප්‍රතික්ෂේප වීම හෝ ඔබේ මුදල් අන් අයකුගේ ගිණුමකට බැර වීම සිදුවිය හැක. එබැවින් ඒ පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන්න.

## ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීමේ පියවර (ඉතා පහසුය, අයදුම්පත් අනවශ්‍යයයි)

ඔබගේ ශිෂ්‍යභාවය අලුත් කිරීම සඳහා ඔබ කළයුතු වන්නේ **අදාළ දිනට පෙර ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව නිවැරදිව ගෙවීම පමණි.** මෙසේ ඔබගේ යොමු අංකය නිවැරදිව සඳහන් කර අදාළ ලියාපදිංචිය අලුත් කිරීමේ මුදල තැන්පත් කළහොත්, **ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම දින 03ක් වැනි කාලයක් තුළ සිදුවනු ඇත. (ඔබේ AAT ශිෂ්‍ය හැඳුනුම්පත හෝ ගෙවීම් පිටපත අප වෙත එවීමට අවශ්‍ය නොවේ.)**

ලියාපදිංචිය අලුත් කිරීම අප තොරතුරු පද්ධතියේ යාවත්කාලීන වී දින 3 ක් ඇතුළත ඔබ වෙත SMS පණිවිඩයක් ලැබෙනු ඇත.

